# 1 පරිමිතිය

මෙම පාඩම ඉගෙනීමෙන් ඔබට
- කේන්ද්‍රික ඛණ්ඩයක පරිමිතිය සෙවීමට,
- කේන්ද්‍රික ඛණ්ඩ ආශ්‍රිත තල රූපවල පරිමිතිය සෙවීම සම්බන්ධ ගැටලු විසඳීමට

හැකියාව ලැබෙනු ඇත.

## තල රූපවල පරිමිතිය

සෘජුකෝණාස්‍රය, සමචතුරස්‍රය, ත්‍රිකෝණය සහ වෘත්තය යන තල රූපවල පරිමිතිය සෙවීම පිළිබඳ ව මීට පෙර ශ්‍රේණිවල දී ඔබ හදාරා ඇත. ඒ පිළිබඳ ව කරුණු සාරාංශ කර මෙසේ දැක්විය හැකි ය.

| තල රූපය | | පරිමිතිය |
|---|---|---|
| සෘජුකෝණාස්‍රය |  | 2 (දිග + පළල) |
| සමචතුරස්‍රය |  | 4 × පැත්තක දිග |
| ත්‍රිකෝණය |  | පාද තුනේ දිගෙහි එකතුව |
| වෘත්තය |  | $2\pi$ × අරය |